චක්‍රලේඛ අංක :- 04/2009

මගේ අංකය : බප/සසේකො/අල්.නිර්/2009
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2009.03.18

බස්නාහිර පළාතේ ලියාපදිංචි සියළුම සමූපකාර සමිතිවල
සභාපතිවරුන් වෙත.

**උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීම.**

සමූපකාර සමිතිවල සේවකයින් සමූපකාර ක්ෂේත්‍රයේ සහ අදාල අනිකුත් අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි උසස් මට්ටමේ සුදුසුකම් අත්පත් කර ගැනීම මගින් ඔවුනට මෙන්ම සමූපකාර සමිති වලටද කාර්ය ඵලදායි බව වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසේ.

02. ඒ අනුව එම සමිතිවල සේවයේ නිරත සේවකයින් විසින් අත්පත් කරගනු ලබන උසස් අධ්‍යාපනික සුදුසුකම් වෙනුවෙන් පහත සඳහන් පරිදි දිරි දීමනා ගෙවීමට මෙම කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් ඔවුනට ඒ හා අදාළ ගෙවීම් කිරීමට ක්‍රියා කරන මෙන් කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

03. අදාළ සහතිකයද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මෙම වැටුප් වර්ධක හා දීමනා ලබා දිය යුතු ආකාරය පහත දැක්වේ.

| ලබාගත යුතු සුදුසුකම | | එක්වරක් පමණක් ගෙවන දීමනාව | වැටුප් වර්ධක ගණන |
|---|---|---|---|
| 1. | සමූපකාර සේවකයින්ගේ දැනුවත් බව වැඩිකරලීම සඳහා අනෙකුත් ආයතනවලින් සිය තනතුරට අදාලව සමත් වූ ඩිප්ලෝමා පාඨමාලා | | |
| | X මාස 6ක්/වසරක් දක්වා කාලයක් | රු. 1000.00 | - |
| | X වසරකට වැඩි කාලයක් සඳහා | රු. 1500.00 | 01 |
| 2. | පශ්චාත් උපාධි සහතිකය | රු. 3000.00 | 02 |
| 3. | වරලත් ගණකාධිකරණය හා ඊ හා සමාන වෙනත් විභාග වල අවසන් සහතිකය | රු. 3000.00 | 02 |
| 4. | ගෞරව උපාධිය | රු. 2000.00 | 02 |
| 5. | සාමාන්‍ය උපාධිය හා ඊ හා සමාන පාඨමාලා | රු. 1500.00 | 01 |
| 6. | සමූ. සා. ආයතනය - පොල්ගොල්ල - ඩිප්ලෝමා | රු. 1250.00 | 01 |
| 7. | සමූපකාර උසස්පෙළ (පූර්ණ සාමාර්ථය) | රු. 1000.00 | - |
| 8. | සමූපකාර සාමාන්‍ය පෙළ (පූර්ණ සාමාර්ථය) | රු. 750.00 | - |

04. කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමේදී පහත සඳහන් විස්තරද ඒ සමග ඉදිරිපත් කළ යුතුය.

(1) ලබා ඇති අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික වල සහතික කරන ලද පිටපත්

(11) මෙම සුදුසුකම් කාර්ය ඵලදායකත්වය කෙරෙහි දැනට හෝ ඉදිරියේදී බලපෑ හැකි අන්දම

(111) ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන තිබේද යන්න

05. සමිතිය තනතුරකට බඳවා ගැනීමේදී මූලික සුදුසුකමක් ලෙස ඉහත කී සහතික පත් සලකා ඇතොත් මෙම දීමනාව හිමි නොවේ.

06. දැනටමත් මෙවැනි දිරි දීමනා ලබා ගෙන ඇති සේවකයින්ට මෙම චක්‍රලේඛය අනුව නැවත එම දීමනා ලබා ගත නොහැකිය.

07. මෙම දීමනා ක්‍රමය 2009.03.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

08. උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීමට අදාල මෙයට පෙර නිකුත් කර ඇති සියළුම චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

කේ. කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

<u>පිටපත්</u>

1. බ.ප. පළාත්මාර්ග හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, පළාත්මාර්ග හා සමුපකාර අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ,කළුතර,ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්